**ශ්‍රී ලංකා කැරම් සම්මේලනය - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

ශ්‍රී ලංකා කැරම් සම්මේලනයේ ("සම්මේලනය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගමයේ නියෝගවල (iii) වගන්තියේ 7(xiii) ඡේදයට අනුව. | සම්මේලනය විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු නමුත් 2021 වර්ෂය සඳහා වූ සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන ඉහත පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2022 ජූනි 17 දින සිට සම්මේලනයට පත් වූ නව නිලධාරීන් 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2023 ජූනි 21 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සම්මේලනයේ ලියාපදිංචිය 2021 පෙබරවාරි 05 සිට 2022 ජූනි 16 දක්වා තාවකාලිකව අත්හිටුවා එහි අධීක්ෂණ බලය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා තිබුණි. | විධායක කමිටුවේ නව නිලධාරීන් 2022 ජූනි 17 සිට පත් කරන ලදී. විධායක කමිටුවෙහි පෙර නිලධාරීන් විසින් සම්මේලනයට අයත් පෙර ලියකියවිලි කිසිවක් නව විධායක කමිටු නිලධාරීන් හට භාර දී නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දැඩි දුෂ්කරතාවකට මුහුණ දීමට සිදු විය. | සම්මේලනය සෑම වසරකම මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. එමෙන්ම ක්‍රීඩා පනතේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 17.19 ඡේදයට අනුව | දේපල, පිරියත සහ උපකරණවල ඵලදායී ජීව කාලයෙහි ප්‍රමාණාත්මක වෙනසක් අපේක්ෂා කරන්නේ නම්, වත්මන් ක්ෂයවීම් ප්‍රතිපත්තිය නැවත සලකා බැලිය යුතු නමුත්, සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති රු. 2,061,520 ක් වටිනා දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් වූ | පෙර සිටි විධායක කමිටු සාමාජිකයින් විසින් සම්මේලනයට අයත් දේපළ, පිරියත සහ උපකරණ නව විධායක කමිටුව වෙත පවරා නොතිබුණි. | සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, සම්පූර්ණ ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණවල ඵලදායී ජීව කාලය සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කළ යුතුය. |

ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණ අතර සම්මේලනයට ඉහත දේපල, පිරියත සහ උපකරණ භෞතිකව සන්තකයේ නොතිබුණි.

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | වටිනාකම රු. | සාක්ෂි නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ගෙවිය යුතු කුලිය | 1,950,000 | කුලී ගිවිසුම සහ ඉන්වොයිසි | නව නිලධාරීන් වෙත කිසිදු ලියවිල්ලක් භාර නොදීම හේතුවෙන් අදාළ ලේඛන විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. | ගෙවිය යුතු දෑ ශේෂය තහවුරු කර ගැනීම සඳහා විගණනය වෙත ලේඛන ප්‍රමාණවත් ලෙස සපයා තිබිය යුතුය. |
| (ආ) ගෙවිය යුතු දිස්ත්‍රික් සංවර්ධන වියදම් | 26,000 | ශේෂය තහවුරු කිරීම් | -එම- | -එම- |
| (ඇ) ඇතුළත් වීමේ ගාස්තු ආදායම | 102,600 | ලදු පත් | මෙම ආදායම සහභාගිවන්නන් විසින් ජාතික තරඟාවලිය සඳහා මාර්ගගත ගෙවීම් ක්‍රමය ඔස්සේ සම්මේලනය වෙත යවන ලදී. අනාගතයේදී මාර්ගගත ගෙවීම් සඳහා රිසිට්පත් නිකුත් කිරිමට කටයුතු කරනු ඇත. | ආදායම සත්‍යාපනය කිරීම සඳහා විගණන වෙත ලේඛනය ප්‍රමාණවත් ලෙස සපයා තිබිය යුතුය. |
| (ඈ) ලැබිය යුතු ශේෂය | 30,180 | ස්වාධීන සත්‍යාපනය | අතැති මුදල් රු. 30,180ක් නව නිලධාරීන් හට භාරදී නොතිබූ අතර මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ)ඉතුරුම් ගිණුමේ ශේෂය | 1,122 | තහවුරු කිරීම සහ බැංකු පාස්පොත | බැංකු පාස්පොත් නව නිලධාරීන් හට භාරදී නොතිබුණ බැවින් එය විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. | බැංකු ශේෂය තහවුරු කිරීම සඳහා විගණනය වෙත ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) ගෙවිය යුතු වෙනත් | 4,850 | ශේෂය තහවුරු කිරීම | නව නිලධාරීන්ට කිසිදු ලියවිල්ලක් භාර නොදීම හේතුවෙන් ශේෂය තහවුරු | ගෙවිය යුතු ශේෂයේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ශේෂය |

| | | |
|---|---|---|
| | කිරීම විගණනය ඉදිරිපත් කිරීමට නොහැකි විය. | වෙත තහවුරු කිරීම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**1.5.3 කළමනාකරණ අකාර්යක්ෂමතාව**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| රු. 2,223,530 ක් වටිනා දේපල, පිරියත සහ උපකරණ සම්මේලනය සතුව භෞතිකව සන්තකයේ නොතිබූ බැවින් වත්කම් භෞතිකව සත්‍යාපනය කළ නොහැක. | අදාළ වත්කම් අත්පත් කර ගැනීමට නීතිමය පියවර ගනු ඇත. | වත්කම් අත්පත් කර ගැනීම සහ ජංගම නොවන වත්කම් හි පැවැත්ම තහවුරු කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 102,698 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 26,820 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 75,878 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු වියදම් රු. 507,978 කින් සහ මුළු ආදායම රු. 432,100 කින් වැඩි වීම මෙම පිරිහීම සඳහා හේතු විය.

**3. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**3.1 ගෙවිය යුතු ගිණුම**

**3.2**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට පවතින රු. 1,950,000 ක් කුලිය පියවීමට කටයුතු කර නොතිබුණ අතර සහ ගෙවිය යුතු දිස්ත්‍රික් සංවර්ධන වියදම් රු. 26,000 ක් ජංගම වගකීම් යටතේ පෙන්වා නොතිබුණි. | මෙම මුදල් ගෙවීමට අදාළව කිසිදු ඉල්ලීමක් සම්මේලනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |